## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගණම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්ට අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බදු මුදල රු. 15,225,000 ක් වූ අතර වර්ෂයට අදාල බදු වාර්තා අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බදු මුදල රු. 16,143,590 ක් වූයෙන් රු. 918,590 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ සමුච්චිත ලාභයට හඳුනා ගත නොහැකි පෙර වර්ෂ ගැලපුම් වශයෙන් රු. 103,405,215 ක් හර කර තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට තොග තුල විදේශීය දෙමළ චිත්‍රපට/ටෙලි නාට්‍ය මිලදී ගැනීම් වලින් ඉදිරි වර්ෂය සඳහා කරන ලද ගෙවීම් ලෙස හඳුනා ගන්නා ලද රු . 2,544,000 ක් ඇතුලත්ව තිබේ.

(ඈ) අලෙවි අංශයේ විකුණුම් ඒකකයේ වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා අනුව විකිණීම සඳහා ඇති අයිතම වර්ග 100 කට අදාල ඩී.වී.ඩී/සීඩී පට 3,438 ක් තිබුණද ඊට අදාල වටිනාකම ගිණුම්වල දක්වා නොතිබුණි.

#### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සේවාදායක ණයගැතියන්**

(i) රු. 590,034,524 ක් වූ සේවාදායක ණයගැතියන් අතුරින් 2011 දෙසැම්බර් 31 දිනට අඩමාණ ණය වෙන්කිරීම රු. 131,011,201 ක් හෙවත් 22% ක ඉහළ අගයක් ගෙන තිබුණි.

(ii) ණය දීමේ ප්‍රතිපත්තිය අනුව ණය කාල සීමාව එක් මාසයකට සීමා වුවත් ණයගැතියන්ගෙන් මාසයකට වැඩි ණයගැති ප්‍රමාණය 76 % ක් හෙවත් රු.450,361,210 ක් ද, මාස තුනකට වැඩි ණයගැති ප්‍රමාණය 38% ක් හෙවත් 222,787,840 ක්ද විය. වසර තුනට වැඩි සේවාදායක ණයගැති ශේෂය රු.129,018,011 ක් හෙවත් 22% ක් විය.

(iii) එසේම සේවාදායක ණයගැති ශේෂයෙන් 9% ක් හෙවත් රු. 56,039,150 ක් වූ ණය රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු ඒවා වූ අතර එය වර්ෂ 1 සිට 12 දක්වා වූ කාල සීමාවකට අයත් විය. මෙම රාජ්‍ය ආයතනයන්ට , වෙළද හා පාරිභෝගික අමාත්‍යාංශයෙන් රු. 1,619,601 ක්ද, ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් රු. 1,462,000 ක්ද, ජාතික තරුණ සංවිධානයෙන් රු. 4,931,273 ක්ද, මීගමුව නගර සභාවෙන් රු. 1,136,957 ක්ද රාජ්‍ය මුද්‍රණ සංස්ථාවෙන් රු.1,000,000 ක්ද ඇතුලත් විය.

(iv) සේවාදායක ණයගැති ශේෂයෙන් 7% ක් හෙවත් රු. 42,575,585 ක් දේශපාලන පක්ෂයන්ගෙන් අයවිය යුතු වටිනාකම් වූ අතර වර්ෂ 1 සිට 8 දක්වා ව කාලසීමාවකට අයත් විය.

(v) සේවාදායකයකුගේ නමක් සඳහන් නොවන ගිවිසුම් 2 කට අදාල ණයගැති ශේෂ වටිනාකම රු. 320,600 ක් වූ අතර වර්ෂ 14 සිට 16 දක්වා වූ කාලසීමාවකට අයත් විය.

(vi) ආයතන 7 කින් අයවිය යුතු ණය ශේෂ එකතුව රු. 26,355,965 ක් වන අතර ඒවා වසර 2 සිට වසර 10 දක්වා කාලයක් තුළ අය නොවී පවතින ණය බවත් ඉහත ආයතන 7 න් අයවිය යුතු වටිනාකම මුළු ණයගැති ශේෂයෙන් 4 % ක් බවත් නිරීක්ෂණය විය.

**(ආ) විවිධ ණයගැතියන්**

2011 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ රු. 60,114,000 ක් වූ විවිධ ණයගැතියන් සඳහා අඩමාන ණය සඳහා වෙන්කිරීම රු. 21,449,142 ක් හෙවත් 36 % ක් විය. එම ශේෂය තුළ වර්ෂ 2 ක් හා ඊට වැඩි කාලයක සිට පැවත එන, පුද්ගලයන්ගෙන් අයවිය යුතු රු. 324,034 ක් ද, විදේශීය රූපවාහිනී ආයතනයන්ගෙන් අයවිය යුතු රු. 4,101,510 ක්ද, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් අයවිය යුත රු. 17,858,971 ක් සහ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේදී රක්ෂණ සමාගම් වෙතින් අයවිය යුතු රු. 598,523 ක ශේෂයක්ද ඇතුළත්වී තිබුණි. සියයට 36 ක්, අඩමාණ ණය ලෙස වෙන්කිරීමෙන් සංස්ථාවේ විවිධ ණය අයවීම පිළිබඳ පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

**(ඇ) සේවක ණය ගැතියන්**

සේවයෙන් ඉවත්වූ හා විශ්‍රාම ගිය සේවකයන්ගෙන් අයවිය යුතු ශේෂ වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට 100% ක අඩමාණ ණය ලෙස වෙන් කරන ලද මුදල රු. 179,664 ක් විය. අදාල සේවකයින් සේවයෙන් ඉවත් වීමේදී ඔවුන්ගෙන් හෝ පසුව ඇපකරුවන්ගෙන් ණය මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මෙසේ අඩමාණ ණය වෙන්කිරීමට සිදුවී තිබුණි. අදාල

සේවකයින් හා ඇපකරුවන් සේවයෙන් ඉවත්වීම,මියයාම,සේවකයින් විසින් පවරා ඇති නඩු හේතු කොට ගෙන එකී ණය අයකර ගැනීමට නොහැකි වී ඇති බව සභාපති දැනුම් දී ඇත.

**(ඇ) අත්තිකාරම් දීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බාහිර පුද්ගලයකුට වැඩසටහන් නිෂ්පාදනය සඳහා අත්තිකාරම් ලෙස ලබා දී තිබුණු රු. 250,000 ක් ද 2007 හා 2009 වර්ෂයන්හිදි වැඩසටහන් අත්තිකාරම් ලෙස ලබාදි තිබුණ රු. 26,850 ක් ද 2011 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

(ii) 2010 වර්ෂයේදී ලබා නොගත් සේවාවක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවකුට ගෙවන ලද රු.187,500 ක් අදාල පුද්ගලයන්ගෙන් හෝ එම ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි,.

(iii) 2008 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන්ට රු. 450,000 ක් පරිගණක වැඩසටහන් හා අදාල කාර්යයක් සඳහා ලබා දී තිබු නමුත් එකී කාර්යය ප්‍රවර්තන වර්ෂය අවසාන වන විටත් සම්පූර්ණ කරගෙන නොතිබුණි.

**ගෙවිය යුතු ගිණුම්**

2001 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා සේවාදායක ආයතන වෙත රු. 75,184,086 ක් ගෙවීමට තිබු අතර අදාල ආයතන වෙත එම ණය පියවීමට 2011 දෙසැම්බර් 31 දින වන විටද ප්‍රමාණවත් පියවරයන් ගෙන නොතිබුණි. මෙම මුදල් ආපසු ගෙවීමට අදාල ආයතන විසන් ඉල්ලීමක් කළ යුතු බව සභාපති දැනුම් දී ඇත.

**1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවේ රු. 40,024,000 ක්වූ ඉඩම් හා සම්ප්‍රේෂණාගාර පිහිටි ඉඩම් සම්බන්ධ හිමිකම් ඔප්පු , පැවරුම් පත්‍ර , ගැසට් නිවේදනද හා ප්‍රති වෙළඳ ගිවිසුම් යටතේ සංස්ථාවට ලබා ගන්නා ලද චිත්‍රපටවල වටිනාකම නිර්ණය කිරීම සඳහා වැඩසටහන් මිලදී ගැනීමේදී චිත්‍රපටයක මිල තීරණය කිරීම සඳහා යොදා ගන්නා මිණුම් දඬු මොනවාද යන තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුයෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ආ) අවසන් මුල්‍ය ප්‍රකාශය අනුව නඩත්තු ඒකකයේ රු.194,904,000 ක් වටිනා තොග සමීක්ෂණයට ලක් කර ඇතත් සමීක්ෂණ වාර්තාවන්හි තොග වටිනාකම් ඇතුලත් කර නොතිබුණු බැවින් ඉහත වටිනාකම සනාථ කර ගත නොහැකි විය.

## 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1988 අංක 24 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම් පනත | සංස්ථාවේ මාණ්ඩලික හා විධායක ශ්‍රේණි වල නිලධාරීන් වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වුවත්, අදාල නිලධාරීන් 6 දෙනෙකු වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 21: 5 වගන්තියේ VIII හා X ඡේද | චෝදනා වලින් නිලධාරියා නිර්දෝෂ වුවහොත් ගෙවිය යුතු ***"පඩිනඩි"*** යන්නට රාජකාරි දීමනාවක ස්වරූපයෙන් ගෙවන දීමනා කිසිවක් හෝ ඊට ඇතුලත් නොවිය යුතුය. එහෙත් 2011 ජුනි 21 දිනැති අංක 766.02.01 දරන කළමනාකරණ තීරණය මගින් පවතින නීත,රීති, රෙගුලාසි අභිබවා යමින් ඊට පටහැනිව එවැනි නිළධාරීන්ට කොන්දේසි සහිතව ප්‍රසාද දීමනා ගෙවීමට අනුමැතිය ලබා ද තිබුණු අතර එක් නිළධාරියකුට ප්‍රසාද දමනා වශයෙන් රු. 77,500 ක් ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මු.රෙ. 71(i) ඉ සහ 2003 ජුනි 02 දින හා අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අරමුදලේ ප්‍රභවය කුමක් වුවත් නව දීමනා ඇති කිරීමේදී හා ප්‍රතිශෝධනය කිරීමේදී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පූර්ව අධිකාරි බලය ලබාගත යුතු වුවත් ඊට පටහැනිව 2010, 2011 හා 2012 ජුනි වනතුරු එකතුව රු. 27,456,539 ක් ඉන්ධන දිමනා ලෙසද,රු. 4,660,661 ක් ප්‍රවාහන දිමනා වශයෙන්ද ගෙවා තිබුණි. තවද, 2010 ට පෙර සිට ඉන්ධන දිමනා වශයෙන් 2012 තුළදි රු. 1,314,426 ක්ද ගෙවීම සඳහා කටයුතු කර තිබූ අතර එම ගෙවීම් නැවත අයකර ගැනීමට හා අත්හිටුවීමට අමාත්‍යංශ ලේකම්වරයා |

| | | |
|---|---|---|
| | | කරන ලද නියෝගය නොතකා දිගින් දිගටම ගෙවීම් සිදුකර තිබුණි. |
| ii | මු .රෙ.880 | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගෙන නොතිබුණ අතර සංස්ථාවේ මුදල් අයකැමියන් ගෙන් පමණක් ඇප ලබාගෙන තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දින හා අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | (i) 5.1.3 ඡේදය | යාවත්කාලීන කළ සංයුක්ත සැලැස්ම වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2011 වර්ෂය සඳහා එපරිදි කටයුතු කර නොතිබුණි. |
| | (ii) 6.5.1 ඡේදය | 2011 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) 9.4 වගන්තිය | ආයතනයේ නිලධාරීන් අමාත්‍යාංශය හෝ වෙනත් ආයතනයක් වෙත මුදාහැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගත යුතු අතර එම කාලය තුළ කිසිදු ගෙවීමක් නොකළ යුතුය. එහෙත් එම චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සංස්ථාව විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 06 දෙනෙකු සංස්ථා සේවයෙන් මුදාහැර තිබුණු අතර 2011 සැප්තැම්බර් 30 දින වනවිට එම නිලධාරීන් වෙනුවෙන් සංස්ථාව රු. 4,276,954 ක වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණද, ප්‍රතිපූර්ණ කර ගෙන නොතිබුණි. |
| (ඉ) | 2008 ජුලි 28 දින හා අංක පීඊඩී/ 50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 1999 ඔක්තෝබර් 08 දින හා අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛන ප්‍රතිපාදන වලට පටහැනිව ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හිමිකම ලෙස දක්වමින් MM වැටුප් කාණ්ඩයේ හා JM වැටුප් කාණ්ඩයේ නිලධාරීන් හට 2010 හා 2011 වර්ෂ වලදී පිළිවෙලින් නිලධාරීන් 96 ක් හා 92 කට ඉන්ධන දීමනාවද නිලධාරීන් 98 ක් හා 94 කට ප්‍රවාහන දීමනාද ගෙවා තිබුණි. |

### 1.2.5 මතභේදයට තුඩු දෙන ගණුදෙණු

සංස්ථාව විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සංස්ථා සේවයෙන් මුදාහැර තිබුණු නිලධාරීන් 06ක් වෙනුවෙන් 2010 හා 2011 වර්ෂ සඳහා රු. 240,000 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභය රු. 172,079,000 ට සාපේක්ෂව පෙර වර්ෂයේ ලාභය රු. 42,120,000 ක් වීමෙන් වර්ෂයේ ලාභය රු. 129,959,000 ක වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂය තුලදී දරන ලද රු.169,008,170 ක මුදල පෙර ගෙවුම් ලෙස ගිණුම් ගත කිරීම ලාභය වැඩිවීමට හේතු වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

2010 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රූපවාහිනී විකාශන කාලය විකිණීමෙන් ලද ආදායම 29% කින වැඩි වී තිබුණු අතර වෙනත් ආදායම් 19% කින්ද අඩුවී තිබුණි. "චැනල් අයි " විකාශන කාලය විකිණීමෙන් ඉකුත් වර්ෂයට වඩා රු. 507,796,000 කින් හෙවත් සියයට 147 කින් ආදායම වැඩි වී තිබුණු අතර එයට හේතු වී තිබුණේ “ 2011 ලෝක ක්‍රිකට් තරඟාවලිය” විකාශය කිරීම වේ. ප්‍රධාන නාලිකාව වන "චැනල් වන් " මගින් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු ආදායම රු. 1,340,696,000 ක් වූ අතර ඉකුත් වර්ෂයේ රු. 1,338,943,000 ක ආදායම සමඟ සැසඳීමේදී වැඩිවීම සියයට 0.13 ක් වී තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

| ද්‍රවශීලතා අනුපාත | සම්මත අනුපාතය | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 2:1 | 1:0.25 | 1:0.22 | 1:0.25 |
| ක්ෂණික අනුපාතය | 1:1 | 1:0.34 | 1:0.18 | 1:0.32 |

ඉහත තොරතුරු අනුව ද්‍රවශීලතා අනුපාතය සම්මත අනුපාතයෙන් බැහැරව පවතින බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **සංස්ථාවට එරෙහිව/එදිරිව ගොනු කරන ලද නඩු**

සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශවයන් හා සංස්ථා කාර්ය මණ්ඩලය විසින් පිළිවෙලින් නඩු 07 ක් හා 11 ක් පවරා තිබුණි. මෙම නඩු සඳහා නිතීඥ ගාස්තු වශයෙන් බාහිර නිතිඥයින්ට රු. 5,051,095 ක මුදලක් ගෙවා තිබුණි. බාහිර පාර්ශවයන් විසින් පවරන ලද නඩු 07 කට අදාලව පැමිණිලි පාර්ශ්වය විසින් ඉල්ලා ඇති වන්දි මුදල රු. 1,016,500,000 ක් හා එ.ජ.ඩොලර් 250,000 ක් විය. එසේම රූපවාහිනී සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 32 ක් පවරා තිබු අතර එම නඩු වලින් සංස්ථාව අයකර ගැනීමට බලාපොරොත්තු වන මුදල රු. 134,083,200 ක් විය. එයින් නඩු 03 ක් සමාලෝචිත වර්ෂය තුලදී අවසන් වූ අතර සංස්ථාව අයකරගත් මුදල රු.486,448 ක් විය. මෙම නඩු සඳහා නිතීඥ ගාස්තු වශයෙන් බාහිර නිතිඥයින්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය රු. 696,250 ක් විය. මුල්‍ය ප්‍රකාශයන්හි ගිණුම් සටහන්හි දක්වා ඇති නඩු සම්බන්ධ අසම්භාව්‍ය වගකීම්හි වටිනාකම රු. 1,554,000,000 ක් විය.

(ආ) 1992 හා 1994 වර්ෂ වලදී ලංකා පුවත් ආයතනයේ රු. 1,104,000 ක් ආයෝජනය කර තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණු අතර එම ආයෝජන තවදුරටත් එසේම පවත්වා ගෙන ගොස් තිබුණි .

(ඇ) සාමාන්‍ය වෙළඳ ගිවිසුම් සඳහා මුදල් අයකර ගැනීමේ සංස්ථා ප්‍රතිපත්තිය වන්නේ ගිවිසුමට අදාල සම්පූර්ණ ගුවන් කාලය සැපයීමෙන් පසුව ඉන්වොයිස් පත් නිකුත් කර මුදල් ලබාගැනීමයි. මේ අනුව ගිවිසුම් කාලය වසරක් වැනි දීර්ඝ කාලයක් වුවහොත් එම මුළු වර්ෂයේම ආදායම ලබාගන්නේ අදාල ගුවන් කාලය සපයා වසරකටත් වඩා ඉක්ම ගිය පසුව වේ.මෙම ප්‍රතිපත්තිය සංස්ථාවට අයවිය යුතු ණය මුදල් අයකර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) **ප්‍රති වෙළඳ ගිවිසුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ ප්‍රති වෙළඳ ගිවිසුම් ආදායම රු. 58,009,000 ක් වු අතර වියදම රු. 65,996,000 ක් විය. මේ අනුව ප්‍රති වෙළඳ ගිවිසුම් වලින් සංස්ථාව ලැබු පාඩුව රු. 7,987,000 ක් වු අතර මෙම පාඩුව ප්‍රති වෙළඳ ආදායමට සාපේක්ෂව 14 % ක් විය.

(ii) ණයගැති ශේෂය තුල ඇතුලත් රු. 6,572,750 ක් වු ප්‍රතිවෙළඳ ගිවිසුම් 05 ක් වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර නොතිබුණ අතර මෙම ආයතන පෙරලා සංස්ථාව වෙත කිසිදු සේවාවක් සපයා නොතිබුණි.

(iii) චිත්‍රපට මිලදී ගැනීම සඳහා එළඹි ප්‍රති වෙළඳ ගිවිසුම් හැර අනෙකුත් සියළුම ප්‍රති වෙළඳ ගිවිසුම්වල පහත වගන්තිය ගිවිසුමේ අන්තර්ගත කර ඇත. "ගිවිසුම්ගත කාලය තුළ අදාල

වටිනාකමට සැහෙන සේවාවක් ලබාගෙන නොමැති නම් එම පාඩුව ආයතනය විසින් දරාගත යුතුය." සංස්ථාව විසින් එළඹි ප්‍රති වෙළඳ ගිවිසුමකින් සංස්ථාවට රු. 1,845,740 ක වාසිදායක තත්වයක් ඇතිව තිබුණද එම වාසිදායක තත්ත්වය සංස්ථාවට ලබා නොගෙන ඊට පසු එළඹි ගිවිසුමකට මෙම වාසිදායක තත්ත්වය හිලව් වෙමින් පැවතුණි.

(iv) 2011 වර්ෂයේදී සංස්ථාව චිත්‍රපට 2 ක් සඳහා ප්‍රති වෙළඳ ගිවිසුම් වලට එළඹි අතර ගිවිසුමට එළඹෙන දිනම අදාල චිත්‍රපට සංස්ථාවට ලබා දිය යුතු වූවත්, එක් වෙළඳ ගිවිසුමකදී ඊට අනුකූලව කටයුතු තර නොතිබූ අතර පමා කාලය මාස 09 ක් විය. 2011 නොවැම්බර් වන විට සංස්ථාව විසින් සපයා තිබූ ගුවන් කාලයේ වටිනාකම රු. 12,940,000 ක් විය.

(iv) යම් කාලසීමාවක් ඉකුත් වූ පසු එම ප්‍රතිවෙළඳ ගිවිසුම්හි පවතින හර හෝ බැර ශේෂ අවලංගු වන අකාරයේ ගිවිසුම් වලට එළඹි නමුත් රු. 1,226,285 ක් වටිනා ගිණුම් ශේෂයන් අදාල කාලසීමාව ඉකුත්වී තිබියදීත් තවදුරටත් ණය හිමි ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශන වල නිරූපනය විය.

(v) එක් ප්‍රති වෙළඳ ගිවිසුමකින් සංස්ථාවට වාසිදායක ශේෂයක් ඇතිව තිබියදී එම වාසිය ලබා නොගෙන බාහිර පාර්ශවයට වාසිදායක වන ආකාරයට දෙවරක් ගිවිසුම සංශෝධනය කර තිබූ අතර අවසානයේදී එම ගිවිසුමෙන් සංස්ථාවට රු. 10,966,915 ක අවාසිදායක තත්වයක් ඇතිවී තිබුණි.

(ආ) **ටෙලි නාට්‍ය මිලදී ගැනීම**

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණන නියැදි පරීක්ෂණයට භාජනය ව ටෙලි නාට්‍යය හතරක් අතරින් නාට්‍යය දෙකකින් සංස්ථාව ලැබූ අලාභය රු. 24,203,558 ක් විය.

(ii) විගණන නියැදි පරීක්ෂණයට භාජනය වු ටෙලි නාට්‍යය දහතුනකින් ටෙලි නාට්‍යය හතරක් සංස්ථාව හා ටෙලි නාට්‍යය නිෂ්පාදක අතර නීත්‍යානුකූල ගිවිසුමකට එළැඹීමට පෙර විකාශය කර තිබුණි.

(iii) විකාශය කිරීම සඳහා ටෙලිනාට්‍ය තෝරා ගැනීමේ පටිපාටිය අනුව ස්වාධීන සමීක්ෂණ මණ්ඩලයක නියමයන් හා තීරණයන්ට යටත්ව අනමැතිය ලබාදිය යුතු වුවද විගණන නියැදි පරීක්ෂණයට භාජනය වු ටෙලි නාට්‍යය දහතුනකින් ටෙලි නාට්‍යය දෙකක් එවැනි සමීක්ෂණ මණ්ඩලයකට ඉදිරිපත් නොකර විකාශය කර තිබුණි.

(iv) සමීක්ෂණ මණ්ඩලය ටෙලි නාට්‍යය සමීක්ෂණය කර විකාශය සඳහා වඩා යෝග්‍ය යැයි නිර්දේශ කරන ලද විකාශ කාලය හා සත්‍ය විකාශ කාලය වෙනස්වූ අවස්ථා ගණන විගණනයේ නියැදි පරීක්ෂණයට භාජනය වු ටෙලි නාට්‍යය දහතුනකින් ටෙලි නාට්‍යය 05 ක් සඳහා විය. සමහර අවස්ථා වලදී එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි බවත්

උදාහරණ ලෙස මෙගා ටෙලි නාට්‍යය කොටස් සියල්ල සමීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ නොහැකි බවත් සභාපති දැනුම් දී ඇත.

(v) ටෙලි නාට්‍ය සඳහා ගෙවන මුදල තීරණය කිරීමේදී සමීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් ලකුණු සැලකිල්ලට ගනු ලැබීම මූලිකම කරුණක් වුවද විගණන නියැදි පරීක්ෂණයට භාජනය වූ ටෙලි නාට්‍යය දහතුනකින් ටෙලි නාට්‍යය 03 ක් මිලදී ගෙන තිබුණේ ඇගයීම් ලකුණු නොමැතිවය.

(vi) ටෙලි නාට්‍යය වීඩියෝ පිටපත් අනුමැතිය සඳහා ඉල්ලුම් පත්‍රයක් , අදාල ගාස්තුව සමඟ ඉදිරිපත් කළ යුතු වුවද විගණන නියැදි පරීක්ෂණයට භාජනය වූ ටෙලි නාට්‍යය දහතුනකින් ටෙලි නාට්‍යය දෙකක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

(ඇ) **භාණ්ඩ අපහරණය හා භාවිතයෙන් ඉවත් කිරීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රූපවාහිනී සංස්ථාව විසින් 2010 හා 2011 වර්ෂවලදී අංශ 15 ක් නවීකරණය කල අතර එම අංශ වලින් ඉවත් කරන ලද භාණ්ඩ පිළිබඳව හා එහි වටිනාකම පිළිබඳව ලිපිගොනු පවත්වා ගැනීම සඳුකර නොතිබුණි.

(ii) 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි 08 උපලේඛනය අනුව ඉවත් කිරීම් ලෙස දක්වා ඇත්තේ රු. 593,000 ක් වටිනා පිරියත් යන්ත්‍ර හා උපකරණ සහ රූපවාහිනී යන්ත්‍ර වුවත් භාණ්ඩ වෙනත් ආයතනයන්ට ප්‍රදානය කල තොරතුරු ඇතුලත් ලිපිගොනුව අනුව ගෘහ භාණ්ඩ ,පරිගණක හා අනෙකුත් භාණ්ඩ ඉවත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර එම වත්කම්හි වටිනාකම ගණනය කිරීමක්ද සිදු කර නොතිබුණි. එසේම මෙම ඉවත් කරන ලද වත්කම් තවදුරටත් මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන බව නිරීක්ෂණය විය.

### 3.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

(අ) රූපවාහිනි ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලයේ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා එහි කටයුතු පරිගණක ගත කොට වැඩිදියුණු කිරීම අරමුණු කර රු. 1,734,000 ක් වැයකර 2005 වර්ෂයේ මිලදී ගෙන ඇති ස්වයංක්‍රිය බාර්කෝඩ් පද්ධතියෙහි ( Automated Barcode Solution ) කොටස් කීපයක් හා විද්‍යුත් කැසට් ආරක්ෂණ පද්ධතිය ( EAS System ) 2012 මැයි මාසය අවසාන වන විටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණු අතර එම ඇන්ටෙනාහි පැවැත්ම පිළිබඳව වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා මගින් හෙළිදරව් නොවුණි.

(ආ) ඉංජිනේරු අංශයෙහ රු.18,053,000 ක්වූ අමතර කොටස් හා රු.170,000 ක්වූ පටිගත කරන ලද කැසට් පට චලනය නොවන තොග ලෙස පැවතුණි.

## 3.4 හඳුනාගන්නා ලද පාඩු

2011 වර්ෂයේදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 06 කදී රු.12,766,629 ක අයවීම් කපාහැරීමට තීරණය කර තිබුණි. මෙයින් රු. 2,064,841 ක් සංස්ථාව විසින් එලැඹි ගණුදෙනුවලට අදාලව පිළිගත හැකි ලිඛිත ලියවිල්ලක් /ප්‍රමාණවත් ලියවිල්ලක් නොමැතිකම හා නිසිපරිදි අදාළ ලිපිගොනුව නඩත්තු නොකිරීම නිසා අයකර ගැනීමට නොහැකි ණය වේ. රු. 2,291,697 ක් විධිමත් අනුමැතියක් නොමැතිව දැන්වීම් පෙළගැස්වීම (Schedule without proper approval) /නියමිත වාර ගණනට වඩා වැඩි වාර ගණනක් ප්‍රචාරය කිරීම සඳහා පෙළගැස්වීම (Over scheduling) නිසා අයකර ගැනිමට නොහැකි ණයවන අතර රු. 100,000 ක් ඉන්වොයිස් නිකුත් නොකිරීම නිසා අයකර ගැනිමට නොහැකි ණය වේ. රු. 247,312 ක් ඉටුකරන ලද කාර්යයන් දෙකකට අදාලව පුද්ගලයකුගෙන් අයකර ගත නොහැකි මුදලක් සිනමා කර්මාන්තයේ ප්‍රවර්ධනය වෙනුවෙන් යැයි දක්වමින් කපාහැරීමට තිරණය කළ ණය විය. එසේම කපාහැරීමට තීරණය කල රු. 85,026 ක් සංස්ථා සේවයෙන් ඉවත් වූ/විශ්‍රාම ගත් නිළධාරීන්ගෙන් අයවිය යුතු මුදල් විය.

## 3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජුනි 30 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 985 ක් වු අතර සත්‍ය කාර්ය මණ්ඩලය 1014 ක් විය.

(ආ) සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර දැරීම 2008 අගෝස්තු 05 දින සිට වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් වරුන් විසින් සිදුකරන ලද අතර 2011 නොවැම්බර් 15 දින සිට එම තනතුර සඳහා නිළධාරියකු පත්කර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් කොන්ත්‍රාත් පදනම මත නිළධාරීන් 06 ක් බඳවා ගැනීමේදී විධිමත් පරිදි බඳවා ගැනීමේ පරිපාටිය අනුගමනය කර නොතිබුණි. මෙම නිළධාරීන් වෙනත් ආයතනයකට මුදා හැර තිබුණු අතර මෙම නිලධාරීන්ගේ පැමිණීමේ වාර්තා නිලධාරියා දෛනිකව සේවයට වාර්තා කරන ආයතනයේ අදාළ අධීක්ෂණ නිලධාරියෙකු විසින් සහතික කළයුතු වුවද, නිළධාරීන් දෙදෙනෙකුගේ පැමිණිමේ වාර්තා රූපවාහිනී සංස්ථාවේ ක්‍රියාකාර අධ්‍යක්ෂ/ සංස්ථා මණ්ඩල සාමාජික විසින් සහතික කර තිබුණි. තවද මෙම නිළධාරීන් සඳහා 2011 සැප්තැම්බර් 30 දින වනවිට රු. 4,276,954 ක් වැටුප්, දීමනා ලෙස සංස්ථාවේ මදලින් ගෙවීම් කර තිබුණි.

## 3.6 වාහන පරිභෝජනය

සංස්ථාව සතු වාහන ඇණියෙහි වාහන ගණන 64 ක් වූ අතර එයින් වාහන 12 ක් කුළි පදනම මත ලබාගත් වාහනයි. වෙන්කළ වාහන සංඛ්‍යාව 08 ක් විය. 2011 වර්ෂය තුලදී එම වාහන ධාවනය කළ මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර 1,659,121 ක්වූ අතර නඩත්තු වියදම රු. 6,284,000 ක් හා ඉන්ධන වියදම රු. 14,039,000 ක් විය. ඒ අනුව කිලෝ මීටරයකට දරන ලද නඩත්තු හා ඉන්ධන වියදම පිළිවෙලින් රු.3.79 ක් හා රු. 8.46 ක් විය.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

සංස්ථාවේ අභ්‍යන්තර විගණන ඒකකයේ සේවක සංඛ්‍යාව 06 ක් විය. පලමු අර්ධ වර්ෂය තුල විගණන විමසුම් 09 ක්ද දෙවන අර්ධ වර්ෂය තුල විගණන විමසුම් 12 ක්ද යවා තිබුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

2005 ජුලි 1 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/31 චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් මාස තුනකට එක්වරක්වත් රැස්විය යුතු වුවත් 2011 වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. තවද, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී ගනු ලබන තිරණ ක්‍රියාත්මක කිරීම අසතුටුදායක තත්ත්වයක පැවතුණි.

### 4.3 අයවැය ලේඛනමය පාලනය

ආදායම් නියමිත පරිදි ඇස්තමේන්තු නොකිරීම නිසා අයවැයගත ඉලක්කයට වඩා සියයට 80 සිට සියයට 111 දක්වා පරාසයන්ගෙන් ආදායම වැඩි වී තිබීම් හා සියයට 11 සිට 97 දක්වා පරාසයන්ගෙන් ආදායම අඩුවීම්ද නිරීක්ෂණය විය. වියදමද නිසි ලෙස ඇස්තමේන්තු නොකිරීම නිසා සියයට 28 සිට සියයට 69 දක්වා පරාසයන්ගෙන් වියදමෙහි වැඩිවීම් හා සියයට 27 සිට සියයට 65 දක්වා පරාසයන්ගෙන් වියදමෙහි අඩුවීම්ද නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපති වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ණයගැති /ණයහිමි පාලනය
(ඇ) ගුවන් කාල ආදායම්
(ඈ) අත්තිකාරම්
(ඉ) ප්‍රති වෙළද ගිවිසුම්
(ඊ) ජනල් සටහන්
(උ) ඉන්වොයිස් කිරීම